## 2013 අංක 2 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය සඳහා වූ පනත් කෙටුම්පත පිළිබඳව වූ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මාධ්‍ය නිවේදනය

**2017 ජුනි 06, කොළඹ, ශ්‍රී ලංකාව:** 2013 අංක 2 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය සඳහා වූ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙන් ඉවත් කර ගැනීමට රජය විසින් ගනු ලැබූ තීරණය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) සතුටින් පිළිගනී. මේ බව අද ශ්‍රේෂ්ඨාධිකරණයේ දී දැනුම් දෙන ලද්දේ නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනීසිටි නීතිඥවරයා විසිනි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි විධායක අධ්‍යක්ෂකවරයා විසින් ගොනු කළ පෙත්සම (SC SD 7/2017) ඇතුළු කෙටුම්පත් පනතේ විධිවිධානයන් දෙකක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය අභියෝග කරමින් ගොනු කර තිබූ පෙත්සම් දෙකක් විශේෂ විනිශ්චය පිණිස විභාගයට ගත් අවස්ථාවේදී මේ බව දැනුම් දෙනු ලැබිණි.

කෙටුම්පත් පනතේ 2වැනි වගන්තියේ ඇතුලත් 6අ(2) සහ (6) වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4(d), 11, 12(1), 13(1), 13(2), 13(3), 14(1) සහ 17 යන ව්‍යවස්ථාවන්ට අනුකූල නොවන බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් තර්ක කරන ලදී. මෙම විධිවිධානයන් නීති බවට පත් වුවහොත් එමගින් යම් සැකකරුවෙකු පොලිස් ස්ථානයක රඳවා ඇති විටක සිදුකරමින් පවතින පරීක්ෂණයන්හට “බලපාන” හෝ “අගතිගාමී ලෙස බලපාන” යන පදනමින් සැකකරුවකු වෙත හෝ පොලිස් ස්ථානයක් වෙත නීතිඥයකු ප්‍රවේශවීම වැලැක්වීමට පොලිස් ස්ථානාධිපතිවරයකුට ඉඩකඩ සැලසේ. මේ නිසා නීතිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අත්අඩංගුවේ සිටින පුද්ගලයන්හට සහතික කොට ඇති අයිතිවාසිකම් වලට මෙම විධිවිධානයන් පටහැණි වේ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් තර්ක කරණු ලැබුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වන සාධාරණ නඩු විභාගයකට ඇති අයිතියට අත්අඩංගුවේ සිටින ඕනෑම පුද්ගලයකුහට නීතිඥ සහාය ලබා ගැනීමට ඇති අයිතිය ද ඇතුලත්වන බවයි. කෙටුම්පත් පනතේ දෙවන වගන්තියේ ඇතුලත් 6අ(2) සහ (6) වගන්ති ඉතා අපහැදිලි ලෙස කෙටුම්පත් කර ඇති අතර රැඳවියකුහට නීතිඥයකු වෙත වන ප්‍රවේශයෙහි හෝ පරීක්ෂණයක් සිදුකරමින් පවතින විටක පොලිස් ස්ථානයක් වෙත වන නීතිඥයකුගේ ප්‍රවේශයෙහි “අගතිගාමී බලපෑම” නිර්ණය කිරීමේ විෂයානුබද්ධ නිර්ණායකයන් පිළිබඳව සඳහනක් නොමැත. මෙමගින් තම සේවාලාභියා ප්‍රමාණවත් ලෙස නියෝජනය කිරීමට නීතිඥයකුට ඇති හැකියාවට සීමා පැනවේ. මෙම විධිවිධානයන් ඒවා අවභාවිතයට ඉඩකඩ සලසනසුළු යැයි කිව හැක්කේ එමගින් වදහිංසා පමුණුවනු නොලැබීමට ඇති අයිතිය ඇතුළු රැඳවියන්ගේ අයිතිවාසිකම් වල වැඩිදුර උල්ලංඝණයන් හටද මග සැලසෙන බැවිනි.

තාවකාලික ලෙස පමණක් මෙම විධිවිධානයන් ක්‍රියාත්මක කරණු ලැබීමට යොජනා වී ඇති නමුදු ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (PTA) වැනි මෙවැනිම තාවකාලික නීතිකරණයන් කාලයාගේ ඇවෑමෙන් ස්ථිර නීති බවට පත් වූ බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සැලකිල්ලට ගනී. මෙම කෙටුම්පත් පනත 2017 මාර්තු 6 වන දින ගැසට් කරනු ලැබූ විටදී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් තම කනස්සලු සහගත සැලැකිලිමත් බව පලකර සිටිනු ලැබිණි. අධිකරණයේදී දැනුම් දෙනු ලැබූ කරුණු සැලකිල්ලට ගන්නා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රජය වෙතින් ඉල්ලා සිටින්නේ අදාල සියුළු පරදුපාර්ශවයන් ගේ අදහස් විමසා බැලීම පිණිස අදහස් හා යෝජනා කැඳවීමක් සිදු කරණ ලෙසය. මෙම ක්‍රියාදාමය විනිවිදභාවයෙන් යුතු සහ සියල්ලන් ඇතුලත් කර ගන්නා එකක් වීම සහතික කරනු ලබන්නේ එමගිනි.